අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 50 | S | I, II |
|---|---|---|

| | |
|---|---|
| නාට්‍ය හා රංග කලාව | I, II |
| நாடகமும் அரங்கியலும் | I, II |
| Drama & Theatre | I, II |

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர்- 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

නාට්‍ය හා රංග කලාව (සිංහල) II

- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න

01) දික්තල කාලගෝල නාට්‍යය ඇසුරෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. දික්තල කාලගෝල නාට්‍යයට පාදක කර ගත් ග්‍රන්ථය හා ජාතක කතාව කුමක්ද? (ලකුණු 02)

II. නාට්‍යයේ ප්‍රධාන ගැටුම ඇතිවන්නේ කවුරුන් අතර ද? (ලකුණු 02)

III. දික්පිටියා මහෞෂධ පඩිතුමා ඉදිරියේ දික්තලාගේ නම ලෙස දක්වන ව්‍යාජ නම කුමක් ද? (ලකුණු 02)

IV. නාට්‍යයෙන් ඉස්මතු වන මහෞෂධ පඩිතුමාගේ චරිත ලක්ෂණයක් ලියන්න. (ලකුණු.02)

V. නාට්‍යයේ පසුතල හා ස්ථාන මැවීමට නාට්‍යකරුවා යොදා ඇති උපක්‍රම දෙකක් ලියන්න. (ලකුණු 02)

VI. ජාතක කතාවෙන් නාට්‍යය වෙනස් වන අවස්ථා දෙකක් ලියන්න. (ලකුණු 02)

02) (i) සන්නි යකුම පැවැත්වීමේ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) සන්නි යකුමේ උපත් කතාව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) සන්නි යකුමේ අන්තර් රංග අවස්ථාවක් නම් කර, එහි දක්නට ලැබෙන නාට්‍යමය ලක්ෂණ හතරක් විස්තර කරන්න. (ලකුණු 06)

03) (i) රංගාලෝක පහනක් හා උපකරණයක් නම් කරන්න. (ලකුණු 02)

(ii) රංගාලෝකය අතීතයේ සිට අද දක්වා දියුණු වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) නාට්‍යයකට රංගාලෝකයෙන් ඉටුකර ගනු ලබන සුවිශේෂ කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04) (i) මිනර්වා නාට්‍යයේ පුරෝගාමී නාට්‍යකරුවා නම් කරන්න. (ලකුණු 02)

(ii) ලංකාවේ වේදිකා නාට්‍යකලාවේ අනුවර්තන නාට්‍යකරුවෙක් හා පරිවර්තන නාට්‍යකරුවෙක් බැගින් නම් කර, ඔවුන්ගේ අනුවර්තන හා පරිවර්තන නිර්මාණ එක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අනුවර්තන, පරිවර්තන හා ස්වතන්ත්‍ර නාට්‍ය එකිනෙකට වෙනස් වන්නේ කෙසේදැයි විස්තර කරන්න. (ලකුණු 06)

05) (i) ප්‍රධාන රංගභූමි වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) මනඃකල්පිත භූගෝලීය බෙදීමකට අනුව ප්‍රොසීනියම් රංග භූමිය කොටස් කීයකට බෙදා වෙන් කෙරේ ද? එය ඇඳ දක්වන්න. (ලකුණු 04)

(iii) රංග භූමිය ප්‍රායෝගිකව භාවිත කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 06)

06) (i) ජනකරළිය රංග ආයතනය නිර්මාණය කළ නිර්මාණකරුවා නම් කරන්න. (ලකුණු.02)

(ii) එම නිර්මාණකරුගේ නාට්‍ය නිර්මාණ හතරක් නම් කරන්න. (ලකුණු.04)

(iii) ඔහුගෙන් ලාංකේය නාට්‍ය ක්ෂේත්‍රයට සිදු වූ සේවාව පැහැදිලි කරන්න. (ලකුණු.06)

07) පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කර ගෙන නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩනැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න. ඔබට කැමති පරිදි චරිතවල පුද්ගල නාම, ස්ත්‍රී පුරුෂ බව හෝ චරිත සංඛ්‍යාව වෙනස් කර ගත හැකි ය.

පැතුම් අවුරුදු විසි දෙකක තරුණයෙකි. ඔහු සම්මුඛ පරීක්ෂණයකට යාමට සූදානම්ව සිටිය දී, හැකි ඉක්මනින් රෝහලට පැමිණෙන ලෙස හදිසි පණිවුඩයක් ලැබෙයි. ඔහු කඩිමුඩියේ රෝහලට ගොස් බලන විට.....

(i) පසුබිම, කාලය හා චරිත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම සඳහා (ලකුණු.04)

(ii) චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැගීම සඳහා (ලකුණු.04)

(iii) කුතුහලය සහ චරිතයක නොසිතූ පෙරළියක් සහිත නාට්‍යෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම සඳහා (ලකුණු.04)

*****